**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2014**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරමුදලේ භාරකරුවන් අතර එළඹි භාරකාර ඔප්පුවේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් භාරකරුවන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම භාරකරුවන්ගේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර

පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ගොවීන්ගේ භාරකාර අරමුදල නීත්‍යානුකූලව සම්මත කර නොතිබීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් 1994 මාර්තු 09 දින අත්සන් කර ඇති භාරකාර ගිවිසුම ප්‍රකාර ගොවිසෙත ලොතරැයියෙන් ලැබෙන ආදායම හා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලබා ගන්නා පොළී ආදායම් කෘෂිකාර්මික සංවර්ධනයට හා ගොවීන්ගේ සුභසාධනය ඇතුළු අරමුණු

06 ක් ඉටු කර ගැනීම වෙනුවෙන් අරමුදල පිහිටුවා ගෙන තිබුණි. 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ)ඡේදය ප්‍රකාර අරමුදලක් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇතිනම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට හැකිවන පරිදි රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද ගොවීන්ගේ භාරකාර අරමුදල පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කිරීමට 2014 දෙසැම්බර් 31 වන විටද කටයුතු කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විස්තරය | ශේෂය | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ලැබිය යුතු කෙටිකාලීන ණය | | |
| | (i) ණයගැති පාලන ගිණුම (කෘෂිකාර්මික භාරකාර අරමුදල) | 7,923,175 | ණය ශේෂ ලැයිස්තුව |
| | (ii) ණයගැති පාලන ගිණුම - චක්‍රීය අරමුදල | 44,200,176 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) | ලැබිය යුතු දිගුකාලීන ණය - ගොවි බැංකු ණය | 9,112,579 | උපලේඛන |
| (ඇ) | ජංගම නොවන වගකීම් - ගොවීන්ගේ තැන්පතු | 697,644 | උපලේඛන |
| (ඈ) | ජංගම වත්කම් - ඉතිරිකිරීමේ ගිණුම | 7,241,655 | ශේෂ සනාථ කිරීම |
| (ඉ) | ජංගම නොවන වගකීම් - කොටස් මුදල් | 591,965 | කොටස්කරුවන්ගේ තැන්පතු දැක්වෙන නාම ලේඛනය |

**2.3 ලැබියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෙටි කාලීන ණය යටතේ දක්වා තිබූ වසර 08 ක් ඉක්මවූ ණය ශේෂ 6 ක එකතුව රු.13,297,971 ක් විය.

(ආ) අත්තිකාරම් යටතේ දැක්වෙන රු.8,018,388 ක් වූ ශේෂ 04 ක් වර්ෂ 09 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් බදු පෙර රු.35,779,102 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,632,564 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,146,538 ක ශුද්ධ වර්ධනයක් නිරීක්ෂණය විය. වියදම රු.59,724,916 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන්**

සංවර්ධන කාර්යයන් සඳහා 2012 හා 2013 වර්ෂයන්හි දී ලබා දී තිබූ අත්තිකාරම් ශේෂයන්ගෙන් පිළිවෙලින් රු.2,821,542 ක් හා රු.2,743,525 ක් ලබාදී වසරකට වැඩි කාලයක් ඉක්මවා තිබුණද තවදුරටත් එම ශේෂයන් නිරවුල් නොවී පැවතුණි.

(ආ) **අරමුණට පටහැනි ගෙවීම්**

අරමුදලේ පරමාර්ථවලට පටහැනිව 2013 වර්ෂයේදී රු.6,866,261 ක් හා 2014 වර්ෂයේදී රු.882,978 ක් වශයෙන් රු.7,749,239 ක් ජනාධිපති මන්දිර 5 ක හරිතාගාර ඉදිකිරීම සඳහා වැය කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ අයවැය ලේඛනය අනුව රු.24,078,000 ක ප්‍රතිපාදන වෙන්කළ ව්‍යාපෘති 14 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අරමුදලේ අයවැය ගත වැඩසටහන් 06 ක් සඳහා ප්‍රතිපාදිත මුදල රු.43,289,000 ක් හා තථ්‍ය වියදම රු.11,151,669 ක් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

(අ) මූල්‍ය පාලනය

(ආ) අරමුදල් උපයෝජනය

(ඇ) අයවැය පාලනය